දරුවන් උදෙසා
බයිබලයක්



# කුමාරයා
# එඬේර
# රැකියාවට

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: M. Maillot; Lazarus Alastair Paterson

සකස්කරන්නා: E. Frischbutter; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.


එක් දිනක් ඊජිප්තු වැසියෙක්
හෙබ්‍රෙව් ජාතික වහලෙකුට පහර
දෙනවා මෝසෙස් දුටුවේය.
මෝසෙස් ඉගෙන ගනිමින්
වැඩුනේ ඵාරාවෝගේ
නිවසේ වුනත් ඔහුද
හෙබ්‍රෙව් ජාතිකයෙකි.
ඔහු වහලාට පිහිට
විය යුතුය.

කිසිවෙකු අහළ පහළ සිටීදෝයි බැලූ මෝසෙස්, වහලුන් බලාගන්නා දුෂ්ට ස්වාමියාට පහර දුන්නේය. දෙදෙනා අතර වූ සටනේදී මෝසෙස් අතින් ඊජිප්තු ජාතිකයා මිය ගියේය. ඉක්මනින් ඔහු මළ සිරුර වැළලුවේය.



ඊළඟ දවසේදී හෙබ්‍රෙව් ජාතික දෙදෙනෙකු දබර කරගන්නා හැටි මෝසෙස් දුටුවේය. ඔහු, ඔවුන්ගේ දබරය නවතන්ට උත්සහ කළේය. එවිට එක්කෙනෙක් “ඔබ ඊජිප්තු ජාතිකයා මැරූ විදියටම මාවත් මරාවිදෑ” යි ඇසුවේය. මෝසෙස් බිය වූයේය. පෙරදින සිදුවූ දේ සියල්ලෝ දනිති. ඵාරාවෝද දනියි. මෝසෙස් ගැළවී යා යුතුවේ. ඔහු මිදියන් නම් වූ රටට ගියේය.



මෝසෙස් ළිදක් අසළ ගිමන් හරිද්දී මිදියන් රටේ පූජකයාගේ දූවරු සත්දෙනා ඔවුන්ගේ පියාගේ බැටළු රැළට වතුර දෙනු පිණිස දිය අගල පිරෙව්වෝය.



අනෙක් එඬේරු ඔවුන් එළවා දමන්නට උත්සහ කළෝය.
මෝසෙස් ඒ තරුණියන් ආරක්ෂා කර ඔවුන්ට පිහිට වූයේය.





“ඔබ අද වේලාසනින්!” තරුණියන්ගේ පියා, රෑවෙල් මහ හඬින් කීවේය. සිදු වූ දේ තරුණියන් පැහැදිලි කළ විට “ඒ මනුෂ්‍යයා මෙහි ගෙනෙන්නයැ” යි ඔහු කීවේය. මෝසෙස්, රෑවෙල් ගේ නිවසේ ජීවත් වූයේය.

රෑවෙල්ව, ජෙත්රෝ යන නමින්ද හැඳින්වුණි.

පසු කාලෙක මෝසෙස්, රෑවෙල්ගේ වැඩිමහල් දුව සමඟ විවාහ වූයේය.

මේ අතරතුර ඊජිප්තුවේ ඵාරාවෝ මිය ගියේය. දෙවියන් වහන්සේගේ ජනතාව වූ හෙබ්‍රෙව් ජාතිකයන් තවමත් වහලුන් ලෙස සිටියෝය. ඔවුන්ගේ දුක් වේදනාවලදී ඔවුහු කෙදිරිගෑවෝය.



දෙවියන් වහන්සේගේ පිහිට ඉල්ලා යාච්ඤා කළෝය. දෙවියන් වහන්සේට ඔවුන්ගේ යාච්ඤා ඇසුණි.

මෝසෙස් නොදැන සිටියත්, දෙවියන් වහන්සේ,
වහල් භාවයේ සිටි හෙබ්‍රෙව් ජාතිකයන්ට
උපකාර කරනු පිණිස ඔහුව යොදාගන්නට
සැළසුම් කළසේක. මෝසෙස් ඊජිප්තුව
හැරදමා ඇවිත් අවුරුදු හතළිහක් ගතවී
තිබුණි. ඔහු රැවෙල් ගේ බැටළුවන්
බලාගන්නා එඬේරෙකුව සිටියේය.
නමුත් ඔහු ඊජිප්තුවේ වෙසෙන
ඔහුගේම ජනතාව ගැන සිතුවා
විය හැකිය.



එක් දිනක් මෝසෙස්, අසළ තිබූ පඳුරක්
ගින්නෙන් ඇවිළෙනවා දුටුවේය. නමුත්
ගින්නෙන් පඳුර දැවී නොගියේය.
මෝසෙස් ඊට හේතුව සොයන්නට
තීරණය කළේය.



මෝසෙස් ළං වෙද්දීම දෙවියන් වහන්සේ පඳුර තුළින් ඔහුට කතා කළ සේක. “මෝසෙස්!” “මම මෙහියැ” යි මෝසෙස් කීවේය. “වැඩියෙන් ළං නොවන්නැ” යි දෙවියන් වහන්සේ කී සේක. “ඔබේ පාවහන් ගලවන්න. මන්ද ඔබ සිටිනා ස්ථානය ශුද්ධ බිමකි”.



“මාගේ සෙනඟ ඊජිප්තුවෙන් පිටතට ගෙනෙන්න මම ඔබ ඵාරාවෝ වෙත යවමි” යි දෙවියන් වහන්සේ කී සේක. නමුත් මෝසෙස් යන්නට බිය වූයේය.



දෙවියන් වහන්සේ මෝසෙස්ට උන්වහන්සේගේ මහා
බලය පෙන්වූ සේක. උන්වහන්සේ මෝසෙස් ගේ
සැරයටිය සර්පයෙකු කළසේක.



මෝසෙස් ඒ සර්පයාගේ වලිගයෙන් ඇල්වූ විට එය නැවත සැරයටිය බවට හැරුණි. දෙවියන් වහන්සේ තවත් ළකුණක් දුන් සේක.



“ඔබේ අත පපුව මත තබන්න.” දෙවියන් වහන්සේ අණ කළසේක. මෝසෙස් එසේ කළේය. ඔහුගේ අත ලාදුරු මෙන් සුදු විය.



නැවත ඔහු එසේම කළවිට ඒ අත සුව විය.



නමුත් මෝසෙස් තව දුරටත් අකමැති වූයේය. “මට හොඳින් කතා කළ නොහැකි” යි ඔහු දෙවියන් වහන්සේට කීවේය. දෙවියන් වහන්සේ කෝප වූ සේක. “මම ඔබේ සහෝදර ආරොන්ව ඒ සඳහා යොදාගන්නම්. ඔබ ඔහුට කියන දේ ඔහු විසින් ප්‍රකාශ කරනු ඇත” යි දෙවියන් වහන්සේ කී සේක.



මෝසෙස් ජෙත්රෝගේ නිවසට පැමිණ, තමුන්ගේ බඩු බාහිරාදිය අසුරාගෙන ඊජිප්තුව බලා පිටත්ව ගියේය.



දෙවියන් වහන්සේ මෝසෙස් ගේ සහෝදර ආරොන්ට කඳුකරයේදී මෝසෙස්ව මුණගස්වන්ට සැලැස්සූ සේක. ඊජිප්තු දේශයෙන් හෙබ්‍රෙව් ජනතාව නිදහස් කරගෙන ඒමේ දෙවියන් වහන්සේගේ සැලැස්ම ගැන සම්පූර්ණ විස්තරය මෝසෙස් ආරොන්ට කීවේය. දෙදෙනාම එක්ව ඒ පණිවුඩය හෙබ්‍රෙව් නායකයන් වෙත ගෙන ආවෝය. මෝසෙස් හෙබ්‍රෙව් නායකයන් ඉදිරියේ ළකුණු පෙන්වූ විට, දෙවියන් වහන්සේ ඔවුන්ට පිහිට වන බව ඔවුහු දැනගත්තෝය. සියල්ලෝ හිස් නමා නමස්කාර කළෝය.



මෝසෙස් සහ ආරොන් එඩිතරව ඵාරාවෝ වෙත ගියෝය. “මාගේ ජනතාවට යන්න ඉඩ හරින්න කියා දෙවියන් වහන්සේ කියන සේකැ” යි ඔවුහු ඵාරාවෝට කීවෝය. “මම ඊශ්‍රායෙල් වරුන්ට යන්න නොදෙමි” යි ඵාරාවෝ පිළිතුරු දුන්නේය.



ඔහු දෙවියන් වහන්සේට කීකරු නොවනු ඇත. ඵාරාවෝගේ සිත වෙනස් කරන්නට දෙවියන් වහන්සේට උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ බලය යොදා ගන්නට සිදුවෙනු ඇත.



කුමාරයා එඬේර රැකියාවට

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

නික්මයාම 2-5

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)